**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**අධ්‍යාපන පීඨය**

**පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (නාට්‍ය හා රංග කලාව) සතිඅන්ත - 2017/2018**
**පළමු සෙමෙස්තර පරීක්ෂණය - 2018**

**නාට්‍ය හා රංග කලාව පිළිබඳ මූලධර්ම**

**පැය තුනයි (03)**

**ප්‍රශ්න <u>පහකට</u> (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

**1.** "සෞන්දර්ය උපදින්නේ කලාවෙන් පමණක් නොවේ" මේ පිළිබඳ ඔබේ අදහස් පැහැදිලි කරන්න.

**2.** කලාවේදී අනුකරණයට හිමි ස්ථානය පෙරදිග සහ අපරදිග සෞන්දර්ය දර්ශන ඇසුරින් විමසන්න.

**3.** පහත මාතෘකා අතුරින් ඔබ කැමති <u>දෙකක්</u> පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(අ) නාට්‍ය කලාව, සියලු කලා ශිල්පවල එකතුවක් ලෙස

(ආ) ධ්වනිවාදය

(ඇ) ස්ත්‍රීවාදය

(ඈ) පශ්චාත් ව්‍යුහවාදය

**4.** අලංකාරවාදී සිද්ධාන්ත උදාහරණ සපයමින් පැහැදිලි කරන්න.

5. නාට්‍ය වර්ගීකරණය පිළිබඳ ඔබ දන්නා විවිධ ප්‍රවේශ ගැන කෙටි විස්තරයක් දක්වමින්, නාට්‍යයක කතා වින්‍යාසය මුල්කරගත් සාකල්‍යවාදී වර්ගීකරණ ප්‍රවේශයක් යෝජනා කරන්න.

6. භරතමුනිගේ රස වින්දන න්‍යායද විමසමින් කලා වින්දනය හා කලාවේ සමාජ කාර්යභාරය ගැන රචනාවක් ලියන්න.

7. සෞන්දර්ය ආකල්ප යනු කුමක්දැයි විස්තරාත්මකව පැහැදිලි කරන්න.

8. 'ඊඩිපස් රජ' නාට්‍යය පාදක කොට ගෙන ඇරිස්ටෝටල්ගේ නාට්‍ය සිද්ධාන්ත පිළිබඳ විග්‍රහයක් කරන්න.

9. 'ඇන්ටිගනී' නාට්‍යය ඇසුරෙන් හේගල් ට්‍රැජඩි නාට්‍යය පිළිබඳව ඉදිරිපත් කර ඇති අදහස් පැහැදිලි කරන්න.

10. නාට්‍ය රංගයක් ඇගයීම උදෙසා විචාරකයෙක් ලෙස ඔබ ගන්නා පියවර එකිනෙක විස්තර කරමින් නාට්‍ය හා රංග කලා විචාරය උදෙසා ප්‍රශස්ත ප්‍රවේශයක් යෝජනා කරන්න.

O∘O∘O∘O∘O∘O∘O∘O∘